**තලවාකැලේ ලිඳුල නගර සභාව - 2023**

**------------------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

තලවාකැලේ ලිඳුල නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තලවාකැලේ ලිඳුල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මුල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ  වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රකාරව නගර සභාවේ  කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ සම්පිණ්ඩන වාර්තාවේ 1.2.1 ඡේදය සහ 1.2.2 ඡේදයේ (අ) - (I)/(II),(ඇ), (ඉ) හා (උ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ මිළට ගත් හා පරිත්‍යාග ලෙස ලැබී තිබුණු රු.599,615 ක පුස්තකාල පොත් හා රු.2,880,397 ක ලී බඩු හා සවි කිරීම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | වත්කම් ප්‍රාග්ධනති කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ඉකුත් වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු ලෙස අධිඇස්තමේන්තුගත කළ රු.414,080 ක් සමුච්චිත අරමුදලින් කපා හැරිය යුතු වුවද, ජ'නල් සටහන් අංක 23 න් රු.63,500 ක් පමණක් කපා හැර තිබුණි. | ඉදිරියේදී නිවැරදි කරන බව | ගිණුම් නිවැරදි කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.912,440 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණු අතර උසාවි දඩ වසර 03 ක් තුළ රු.3,046,422 ක් අධි ඇස්තමේන්තු කිරීම සමුච්චිත අරමුදලට ගලපා නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට සංවර්ධන ව්‍යාපෘතියක රු.396,950 ක් ණයහිමියන් වැඩියෙන් දැක්විණි. | ඉදිරි වර්ෂයේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරන බව | මූල්‍ය ප්‍රකාශන සඳහා නිවැරදි වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ රු.1,282,358 කට මිළදී ගෙන තිබුණු යන්ත්‍ර හා උපකරණ ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඊ) | බඩු වට්ටෝරු ලේඛනයේ ඇතුළත් භාණ්ඩ 14 ක වටිනාකම රු.240,700 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර භාණ්ඩ ඒකක 10 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (උ) | පොදු ගබඩා යටතේ දැක්විය යුතු රු.2,509,653 ක තොග ඒකක 40 ක් ලී බඩු හා සවි කිරීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. රු.11,157,848 ක යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වටිනාකම තුළ රු.1,000,653 ක පාරිභෝජන ද්‍රව්‍ය ඇතුළත් වී තිබුණි. | - එම - | - එම - |

1.6.2. නොසැසඳුනු පාලන ගිණුම්

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට මූල්‍ය ප්‍රකාශන වල දක්වන ලද ගිණුම් ශේෂ 02 ක ශේෂයන් ඊට අදාල උපලේඛණ වල සඳහන් ශේෂයන් සමග සැසදීමේ දී රු.3,597,101 ක වෙනසක් පැවතුණි. | 2024 වර්ෂයේ නිවැරදි කර ඇති බව. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදි කළ යුතුය. |

1.6.3. විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ඒකතුව රු.6,965,508 ක ගිණුම් ශේෂ 12 කට අදාළ ලේඛන ලිපිගොනු හා උපලේඛණ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය. | 2024 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇති බව. | ශේෂ සනාථ කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| i. | මු.රෙ. 189 හා 486 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද බැංකු සැසඳුම තුළ 2021 මැයි 10 දින සිට පැවත එන රු.100,000 ක අගරු චෙක්පත් පැවතුණි. | මේ සඳහා නඩුවක් ගොනුකර ඇති බව. | නඩු තීරණය අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | මු.රෙ. 571 (3) | කාලය ඉකුත් වූ අවස්ථා 11 කට අදාළ රු. 315,530 ක තැන්පත් නිරවුල් කර නොතිබුණි. | මෙම අත්තිකාරම් දැනට පියවීමට කටයුතු කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය |

1.8 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 13 දිනැතිව ඉදිරිපත් කළ ගොඩනැගිලි අයදුම්පතකට සැලසුම් කමිටුව මගින් අනුමත කර නොතිබුණද, නගර සභා සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයේ ජනවාරි 25 දිනැතිව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා සංවර්ධන බලපත්‍රයක් අනුමත කර බලපත්‍ර නිකුත් කර තිබුණි. | අදාල ලිපි ගොනු සැලසුම් කමිටුවට යොමු කර එමගින් අනුමත කරනු ලබන අයදුම්පත් සඳහා පමණක් සංවර්ධන බලපත්‍ර අනුමත කිරීමට කටයුතු කරන බව. | පවතනින නීතිරීති රාමුව තුළ කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.863,691 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,345,147 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| )i) | වරිපනම් හා බදු | 6,460,000 | 6,177,380 | 5,267,314 | 4,792,030 | 6,780,000 | 6,724,918 | 6,148,583 | 3,881,965 |
| (ii) | කඩ කුලී | 7,733,500 | 11,042,794 | 10,869,206 | 6,207,618 | 10,045,040 | 11,805,249 | 11,338,817 | 6,034,029 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,676,000 | - | 1,077,000 | - | 895,000 | 594,000 | 594,000 | - |
| (iv) | වෙනත් ආදායම් | 5,962,600 | 5,055,918 | 3,970,008 | 6,579,142 | 59,801,720 | 7,500,000 | 8,597,808 | 5,493,232 |
| | | 21,832,100 | 22,276,092 | 21,183,528 | 17,578,790 | 77,521,760 | 26,624,167 | 26,679,208 | 15,409,226 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් කළමනාකරණය. | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට සභාවට අයවිය යුතු පෙර වර්ෂවල හිඟයෙන් රු.4,608,817 ක්ද, සති පොළ ගාස්තු හා තානායම් කුලී රු.1,289,000 කින් කිසිදු මුදලක් අය කර නොතිබුණු අතර වරිපනම් බදු, ගෙවල් කුලී හා බිම්බදු හිඟ ආදායම් රැස් කිරීම සියයට 01 සිට 23 දක්වා අඩු මට්ටමක පැවතුණි. | 2024 වර්ෂයේ ජංගම සේවා මඟින් ආදායම් රැස්කිරීමේ කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇති බව. | පනතේ විධිවිධාන අනුව හිඟ ආදායම් රැස් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වරිපනම් බදු | | |
| i. | 1946 අගෝස්තු 07 දිනැති අංක 30 දරන වරිපනම් හා තක්සේරු පනතේ 20 වන වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ සියළු නිශ්චල දේපල වසර 05 කට වරක්වත් තක්සේරු කළ යුතු වුවද, ඒ අනුව කටයුතු නොකර 2011 වර්ෂයේ තක්සේරුව මත වරිපනම් බදු අය කර තිබුණි. | දැනට දේපල තක්සේරු කටයුතු නිම කර ඇති අතර ,ඒ පිළිබඳ වාර්තාව තවමත් ලැබී නොමැති බව | වරිපනම් තක්සේරුව කාලීනව සිදු කරවා ගත යුතුය. |
| ii. | නගර සභා ආඥා පනත (255 අධිකාරිය) 170 වගන්තිය අනුව කටයුතු කර වසර 05 සිට වසර 18 දක්වා කාලයක සිට හිඟව පැවති රු.2,993,419 ක වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2024 ජූනි මාසය වන විට දේපල තහනම් කිරීමේ කටයුතු කිරීමට කටයුතු සංවිධානය කර ඇති බව. | හිඟ ආදායම් අය කළ යුතුය. |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | | |
| i. | නගර සභා බල ප්‍රදේශයේ පවතින ව්‍යාපාර ආයතන සඳහා බලපත්‍ර ගාස්තු ලබාගත යුතු නමුත්, සමාලෝචිත වර්ෂයේ සමීක්ෂණය කර තිබුණු ව්‍යාපාර ආයතන 134 ක් බලපත්‍ර ලබා ගෙන නොතිබුණි. | 2024 වර්ෂයේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව | පනතේ විධි විධාන අනුව වෙළඳ බලපත්‍ර ආදායම් බිල්කර අය කළ යුතුය. |

(ඇ) උසාවි දඩ හා මුද්දර ගාස්තු

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.3,913,182 ක් හා මුද්දර ගාස්තු රු.2,665,960 ක් විය. | මේ සම්බන්ධව ලිපි නිකුත් කර ඇති බව. | ආදායම් ගෙන්වා ගත යුතුය. |

(ඉ) වෙනත් ආදායම්

| | | |
|---|---|---|
| i. 1952 අංක 06 දරන පළාත් පාලන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ ප්‍රචාරණ දැන්වීම් සම්මත අතුරු ව්‍යවස්ථාට අනුව සභාවේ බලපත්‍රයක් රහිතව රු.205,800 ක දැන්වීම් පුවරු 25ක් ප්‍රදර්ශනය කර තිබූ අතර ඒවාට බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | මෙම වර්ෂයේ මේ පිළිබඳ කටයුතු කරන බව. | හිඟ ආදායම් අයකළ යුතුය. |

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාවක් හෝ පාලන වාර්තාවක් සකස් කර නොතිබුණි. | 2024 වර්ෂයේ සකස් කිරීමට කටයුතු කර ඇති බව | කාර්ය සාධන වාර්තාව සකස් කළ යුතුය. |

3.2 අනාර්ථික ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ලොරි රථයක් අළුත්වැඩියාව සඳහා එකතුව රු. 569,890 ක් වැයකර තිබුණද, අදාළ ලොරි රථය භාවිතයට ගත නොහැකි බැවින් ඒ සඳහා වැයකළ මුදල් අනාර්ථික වී තිබුණි. | ස්ටාටර් මෝටර් මෙම වාහනයේ නොමැති බැවින් මෙම වාහනය ධාවන තත්වයේ නොමැති බව | අවශ්‍යතාවය සලකා බලා අළුත්වැඩියාව සිදුකළ යුතුය. |

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තලවාකැලේ පීරිස් මල් ශාලාව අසල අනවසරයෙන් ඉදිකරන තෙමහල් ගොඩනැගිල්ල සම්බන්ධව සභාව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අනවසර ඉදිකිරීම සම්බන්ධයෙන් ලිපි යොමු කර ඇති බව. | අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් නීති මඟින් කටයුතු කළ යුතුය. |
| (ආ) | සභාවේ මහජන පුස්තකාලයට පරිත්‍යාග ලෙස ලැබී තිබුණු ලැප්ටොප්, ප්‍රින්ටර්,ස්කෑනර් ඇතුළු භාණ්ඩ 20 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබූ අතර විගණන දිනය වනවිටත් ඒවා භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | 2024 වර්ෂයේ නිවැරදි කිරීමට කටයුතු කරන බව | වත්කම් ප්‍රාග්ධනීත කළ යුතුය. |

3.4 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෞද්ගලික ව්‍යාපෘතියකින් මහජන පුස්තකාලයට ලබාදී තිබුණු උපකරණ 08 ක් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 18 දින සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | මෙම උපකරණ අදාල ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුලත් කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව | භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති වසර 03 සිට වසර 08 දක්වා කාලයක සිට පවතින රු.15,230,000 ක වාහන 06 ක් හා රු.641,000 ක වත්කම් 03 ක්ද, නිශ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි. | ඉදිරියේදී වෙන්දේසි කිරීමට කටයුතු කරනු ඇති බව. | භාවිතයට ගැනීමට ඇති හැකියාව සලකා බැලිය යුතුය. |

3.5 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | භාවිතයට ගනු ලබන වාහන 04 ක මයිලෝ මීටර් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණු බැවින් 2020 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා කාලය තුළ රු. 5,727,143 ක වැයකළ ඉන්ධන ප්‍රමාණය පිළිබඳව තහවුරු කරගත නොහැකි විය. | මයිලෝ මීටර් අලුත් වැඩියා කිරීමට කටයුතු කරන බව. | මයිලෝමීටර් අළුත්වැඩියා කළ යුතුය. |
| (ආ) | වාහනයක් ජංගම පුස්තකාලයක් ලෙස භාවිතා කිරීමේ අරමුණින් සකසා තිබුණද, එම කාර්යය සඳහා භාවිතා නොකර සහා පරිශ්‍රයේ නිෂ්කාර්යව ගාල් කර තිබුණි. | අලුත් වැඩියා කිරීමට කටයුතු කරනු ඇති බව. | අරමුණුගත කාර්යය සඳහා භාවිතා කළ යුතුය. |

3.6 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩලය සැසඳීමේදී තනතුරු 12 ක පුරප්පාඩු 30 ක් පැවතුණි. | මෙ සම්බන්ධව අදාල බලධාරීන් දැනුවත් කර ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට විශ්‍රාම ගිය, මියගිය හා ස්ථාන මාරු වී ගිය නිළධාරීන් 05 දෙනෙකුගෙන් එකතුව රු.639,986 ක ණය ශේෂ අයකරගෙන නොතිබුණි. | ණයශේෂ ඉදිරියේදී අයකර ගන්නා බව | ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කළ යුතු බව |